**වවුනියාව දකුණු සිංහල ප්‍රාදේශීය සභාව**
**වවුනියාව දිස්ත්‍රික්කය**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 24 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 20 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 23 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වවුනියාව දකුණු සිංහල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

### (ආ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) ප්‍රාදේශීය සභාව සතු ඉඩම් අක්කර 150 ක, කඩ කාමර 13 ක් හා වාහන 03 ක වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි. | සියලුම වත්කම් ගිණුම් ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත . |
| (ii) රු. 3,600,000 ක් වටිනාකමැති ස්ථාවර තැන්පතු 05 ක සමාලෝචිත වර්ෂයට අදාළ පොළිය ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල පොළී අදායම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ . | අදහස් දක්වා නොමැත . |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුද්දර ගාස්තු රු. 672,900 ක් වූ අතර, එම වටිනාකම තුළ වසර 01 සිට වසර 04 ක් දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළ හිඟ මුද්දර ගාස්තු රු. 372,900 ක් ඇතුළත්ව තිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත . |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට හිඟ වාහන කුලී ආදායම රු. 328,982 ක් වූ අතර, ඉන් රු. 260,007 ක් වසර 01 සිට වසර 09 ක් දක්වා වූ කාලයක සිට හිඟව පැවතුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත . |
| (iii) | 2019 දෙසැම්බර් 31 දිනට හිඟ කුලී ආදායම රු. 149,150 ක් වූ අතර, ඉන් රු. 103,350 ක් වසර 01 සිට වසර 03 ක් දක්වා වූ කාලයක සිට හිඟව පැවතුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත . |
| (iv) | 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 15,000 ක අත්තිකාරම් වසර 03 කට අධික කාලයක සිට හිඟව පැවතුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත . |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| ගිණුම් විෂය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 91,176,811 ක් වූ ගිණුම් විෂයන් 02 ක් සඳහා අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූලාශ්‍ර ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත . |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත: | | | |
| - 126 (X)(ආ) වගන්තිය | බල ප්‍රදේශය තුළ සංචාරක වෙළෙන්දන් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | සංචාරක වෙළෙන්දන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය: | | | |
| - 5(7)රීතිය | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි. | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් කළ යුතු වේ | අදහස් දක්වා නොමැත. |
| - 59 රීතිය | සෑම වර්ෂයකම ආරම්භයේදී කර්මාන්ත සම්බන්ධයෙන් සමීක්ෂණයක් කර නොතිබුණි. | රීති ප්‍රකාරව අදාල සමීක්ෂණ ලැයිස්තු නිවැරදිව හා කාලීනව පිළියෙල කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| - 68 රීතිය | සභා බල ප්‍රදේශය තුළ සංවර්ධනය නොකරන ලද ඉඩම් හඳුනාගෙන බද්දක් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව අදාල බදු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| 217 රීතිය | ප්‍රා.ස. 46 අනුව සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව ලේඛනයක් පවත්වා ගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,054,822 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,544,628 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | - | - | - | - | - | - | - | - |
| කුලී | 2,578,600 | 1,323,718 | 1,323,718 | 478,132 | 1,500,000 | 1,495,695 | 1,420,875 | 535,300 |
| බලපත්‍ර ගාස්තු | 385,000 | 1,425,725 | 1,425,725 | - | 1,610,000 | 1,149,200 | 1,149,200 | - |
| වෙනත් ආදායම් | 4,383,000 | 5,444,639 | 6,611,047 | 5,607,546 | 4,176,000 | 3,547,005 | 5,927,758 | 4,008,624 |
| එකතුව | | | | **6,085,678** | | | | **4,543,924** |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු පළාත් සභාව වෙතින් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 4,934,646 ක් හා මුද්දර ගාස්තු රු. 672,900 ක් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් කාලීනව හා අප්‍රමාදීව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

2. මෙහෙයුම් සමාලෝචනය

---

3.1 කාර්ය සාධනය

---

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන කර්තවයයන් පිළිබඳව සිදුකරන ලද පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණු නමුත්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඊට අදාල කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | උචිත කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතුවේ.. | අදහස් දක්වා නොමැත. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. මිලියන 25.94 ක මුදල් ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කර තිබුණු ඉදිකිරීම් ව්‍යාපෘති 29 න් ව්‍යාපෘති 8 ක පමණක් වැඩ නිම කර තිබුණු අතර ව්‍යාපෘති 8 ක වැඩ සම්පූර්ණ කර නොතිබුණි. එසේම, ව්‍යාපෘති 13 ක වැඩ තාවකාලිකව නවතා දමා තිබුණි. | අපේක්ෂිත නිමැවුම් මට්ටම් ලබා ගැනීමට කළමනාකරණය කාර්යක්ෂමව කටයුතු කල යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය එකතු කිරීම, වෙන්කිරීම හා ප්‍රතිචක්‍රීකරණය කිරීම සම්බන්ධ විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු විය යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාහන සහ යන්ත්‍ර සූත්‍ර 30 ක් සභාව සතුව තිබුණද එකී සියලුම වාහන ධාවනය කිරීම සඳහා එක් රියදුරෙකු පමණක් සභාවට අනුයුක්තව තිබුණි. | වාහන හා යන්ත්‍ර සූත්‍ර කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට සුදුසු වැඩ පිළිවෙලක් සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාවේ පැවති තනතුරු පුරප්පාඩු 11 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. | තනතුරු වල පවතින පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කල යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු කල ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත්කොට වරිපනම් බදු නියම කිරීමට හා අය කිරීමට අවශ්‍ය විධිවිධාන පැනවීමට කටයුතු කර නොතිබුණි.** | **පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු කල ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත්කොට වරිපනම් බදු නියම කිරීමට හා අය කිරීමට අවශ්‍ය විධිවිධාන පැනවීමට කටයුතු කල යුතුවේ.** | **අදහස් දක්වා නොමැත.** |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රාදේශීය සභාව සතු වාහන 22 ක වාහන ආදායම් බලපත්‍ර කාලීනව ලබා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය සඳහා වාහන ආදායම් බලපත්‍ර ලබා ගැනීමේදී රු. 24,255 ක දඩ මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. | වාහන ආදායම් බලපත්‍ර කාලීනව ලබා ගැනීමට කටයුතු කල යුතු අතර ඒ සඳහා වන ප්‍රමාදයන් නිසා ගෙවීමට සිදුවන දඩ මුදල් රජයට වැය බරක් නොවිය යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරන ලද රු.1,000,000 ක් වටිනාකමැති කොන්ත්‍රාත් 02 කට අදාළව එළඹ තිබූ ගිවිසුම් වල 1.13 ඡේදය ප්‍රකාරව, දින 204 ක ප්‍රමාද කාලයක් සඳහා අය කළ හැකි උපරිම ප්‍රමාද ගාස්තු රු. 100,000 ක මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නියමිත පරිදි ප්‍රමාද ගාස්තු අය කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත |
| (ඈ) 2018 වර්ෂයේ රු. 396,550 ක වියදමින් ඖෂධ පිටියේ පිහිටි පෞද්ගලික ඉඩමක නළ ළිඳක් ඉදිකර තිබුණු අතර, එම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත |
| (ඉ) හැලඹගස්වැව ළිං 02 ක් ඉදිකිරීම සඳහා රු. 1,177,796 ක මුදලක් වැය කර තිබුණු අතර, මෙම ඉදිකිරීම් වලට අදාලව BOQ අනුව අංක 10 සිට 15 දක්වා වන වැඩ අයිතම සඳහා 125mm පළළ සිමෙන්ති ගඩොල් භාවිතා කළ යුතු වුවත්, ඒ සඳහා 100mm පළල සහිත සිමෙන්ති ගඩොල් භාවිතා කර තිබුණි. එසේ වුවද, මේ සඳහා ගෙවීම් කිරීමේදී 125mm පළළ සහිත සිමෙන්ති ගඩොල් භාවිතා කර ඇති බව දක්වා රු. 355,412 ක මුදලක් උක්ත වැඩ අයිතම සඳහා ගෙවා තිබුණි. | නියමිත ගුණාත්මකභාවය අනුව ඉදිකිරීම් කටයුතු කල යුතුවේ. | අදහස් දක්වා නොමැත |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි තත්ත්වයේ වූ වාහන 08 ක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන අලුත්වැඩියා කර කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

### 3.5.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු කැබලි 68 කින් සමන්විත අක්කර 150 ක ප්‍රමාණයෙන් යුත් ඉඩමක් නිරවුල් කර පවරා ගැනීමට හා වාහන 10 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් වල නිරවුල් අයිතිය සභාව වෙත ලබා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත |

### 3.5.3 නිෂ්ක්‍රීය / ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභාව සතු වාහන 10 ක් වසර 01 සිට වසර 08 දක්වා වූ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් නිෂ්කාර්යව නොපැවැත්වීමටත් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමටත් කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත |
| (ආ) 2013 වර්ෂයේදී රු. 2,298,816 ක් වැයකර ඉදිකර තිබුණු සති පොළවල් 2 ක් 2020 අප්‍රේල් 24 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | වත්කම් නිෂ්කාර්යව නොපැවැත්වීමටත් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමටත් කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත |

### 3.5.4 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු වාහන 09 ක අයිතිය තහවුරු කරන ලියාපදිංචි සහතික නොතිබුණි. | අයිතිය තහවුරු කරන ලියාපදිංචි සහතික ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත |

## 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලසුමක් පිළියෙල කර ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් විගණන සැලසුමක් පිළියෙල කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන සැලසුම් කාලීනව පිළියෙල කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත |

### 4.2 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඉරට්ටපෙරියකුලම ප්‍රදේශයේ පිහිටි ත්‍රීරෝද රථ ගාලෙන් වාහන නැවතුම් පොල ලියාපදිංචි ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන නැවතුම් පොල ලියාපදිංචි ගාස්තුව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත |
| (ආ) නළ ළිං 204 ක නිසි නඩත්තුවක් නොතිබීම නිසා වර්ෂ කිහිපයක සිට ගාස්තු අයකර ගැනීමට නොහැකිව පැවතුණි. | නළ ළිං නිසි ලෙස නඩත්තු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත |